# 12.ඓතිහාසික වැදගත් ස්ථාන



# 12. ඓතිහාසික වැදගත් ස්ථාන

## ජාතික සත්වෝද්‍යානය



වසර 84ක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන දෙහිවල ජාතික සත්වෝද්‍යානය ආරම්භ කර ඇත්තේ 1936.07.03වන දිනය.දෙහිවල නගර මධ්‍යයේ සිට කි.මී.2ක පමණ උද්‍යාන වසම දෙසට වන්නට හෙක්ටයාර 10.1 ක පමණ භූමි ප්‍රමාණයක පිහිටා ඇත.මෙය මීන්මැදුර,කෞතුකාගාරය,සත්ව රෝහල,ආහාර සහ පෝෂණ,අධ්‍යාපන,උද්‍යාන,උපකාරක,ආයතන,ගිණුම්,සංවර්ධන හා ආරක්ෂක වශයෙන් අංශ කිහිපයක් යටතේ ක්‍රියාත්මක වේ.තවද ක්ෂීරපායි විශේෂ 56,පක්ෂීන් විශේෂ 77,උරග විශේෂ 39,මත්ස්‍ය සහ මුහුදු ජීවීන් විශේෂ 75,උභයවරජීවින් විශේෂ03 හා සමනලයින් විශේෂ 14ක් සත්වෝද්‍යානය තුල ජීවත් වේ.2019 වර්ෂය තුල දේශීය සංචාරකයන් 2,216,377ක් හා විදේශීය සංචාරකයන් 226,651 ක් සත්වෝද්‍යානය නැරඹීමට පැමිණ ඇත.ඒ අනුව පසුගිය වර්ෂය තුල රු.මි.1689.288ක වියදමක් දරා ඇති අතර රු.මි.766.13ක ආදායමක් උපයා ඇත.ආසියාවේ පැරණිම සත්ව උද්‍යානය වන දෙහිවල ජාතික සත්වෝද්‍යානය දේශීය විදේශීය සංචාරක ආකර්ෂණය දිනාගත් පාරාදීසයකි.

## වෙරළ තීරය හා ධීවර කර්මාන්තය

බටහිර මුහුදින් සීමාවන දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දෙහිවල බටහිර හා ජයතිලක යන ග්‍රාම නිලධාරී කොට්ඨාසයන්ට අයත් ප්‍රධාන සම්පතක් ලෙස කි.මී.02ක් පමණ වන සුන්දර වෙරළ තීරය හැඳින්විය හැකිය.තවද දෙහිවල ගල්කිස්ස වෙරළ තීරය යනු අප රටේ සුන්දරම වෙරළ තීරයන්ගෙක් එකකි. සංචාරක ආකර්ෂණයෙන් ඉතාම ඉහල තැනක් ගත්තා මෙම වෙරළ තීරය ලාංකික සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛ තැනක් ගනී.




අප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රධාන කර්මාන්තයක් ලෙස ධීවර කර්මාන්තය හැඳින්විය හැක.ඒ අනුව දෙහිවල බටහිර හා ජයතිලක යන ග්‍රාම නිලධාරී වසම්වලට අයත් ධීවර කර්මාන්තයෙන් නිරතවන පවුල්162ක් ද ,මසුන් ගොඩබාන මධ්‍යස්ථාන 01ක් හා ලියාපදිංචි යාත්‍රා 102 ක් ද සක්‍රීය ධීවරයින් 195ක් ද මෙහි ඇත.පසුගිය වසරේ මෙ.ටො.200ක මතෂ්‍ය අස්වැන්නක් ලබා ගෙන ඇති අතර මින් 80% කොට්ඨාසයේපරිභෝජනයට ඉතිරිය ප්‍රදේශයෙන් පිටතටදසපයා ඇත.මෙම සාගර තිරයේ විසිතුරු මසුන්,ඉස්සන් ,පොකිරිස්සන් හා වෙනත් ජීවීන් 60ක් පමණ හඳුනා ගත හැකිය. .





කරගම්පිටිය සුබෝධාරාම මහා විහාරය



1653 ක් 1796 අතර ලංදේසි කාලයේදි මෙම විහාරස්ථානය ආරම්භ වී ඇත.1780 දී කිර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ කාලයේදි කැලණි විහාරවේ බුද්ධ ප්‍රතිමා ඉදි කල ශිල්පියාම මෙහිද ප්‍රතිමාව ඉදි කර ඇත.මෙහි පිටත මාලේ ඇතුළු බිත්තිවල චිත්‍ර පානදුරේ රන්කොත් විහාරයට සමාන වේ.මෙම විහාරස්ථානයේ බුද්ධ ප්‍රතිමා ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පාත්‍ර වී ඇත.මහා ජනක ජාතකය,මණිමෝර ජාතකය,කට්ඨහාරි ජාතකය,මහ උම්මග්ග ජාතකය වැනි ජාතක කථාවල දැක්වන විශේෂ අවස්ථා පිළිබිඹු කෙරන බිතු සිතුවම්වල ශෛලිය රුහුණේ කතළුව පූර්වාරාමය,දොඩන්දූව කුමාරකන්ද විහාරය,මුල්කිරිගල පදුමැහත් විහාරය වැනි ස්ථානවල බිතු සිතුවම්හා සමාන කම් දරයි.

පාමංකඩ ශ්‍රී මහා විහාරය



කෝට්ටේ 6 වන පරාක්‍රමබාහු රජතුමා විසින් කරවන ලද්දකි.පරසතුරු උවදුරු නිසා මෙම විහාරස්ථානය අභාවයට ගොස් තිබූ අතර 1813 දී නැවත පිළිසකර කර ඇත.

## විෂ්ණු කෝවිල



දෙහිවල කළුබෝවිල ඇන්ඩර්සන් පාරේ මී.500ක් පමණ දුර ගිය පසු මෙම කෝවිල දක්නට ලැබේ.ක්‍රි.වර්ෂ 1600 දී මෙම දේවාලය ආරම්භ කර ඇත.වර්ෂයට වතාවක් ශ්‍රී ක්‍රිෂ්ණ ජයන්ති පූජාවක් සහ වෛකුණ්ඩ ඒකදර්ශී මංගල්‍යක් පවත්වනු ලබන අතර දිනකට බැතිමතුන් 500ක් පමණ පිරිසක් වන්දනාමාන කිරීම සඳහා පැමිණෙන බව වාර්තා වේ.